**දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාව**

**අම්පාර දිස්ත්‍රික්කය**

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මැයි 16 දිනද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2010 මැයි 10 දිනද විගණනයට ඉදිරිපත් කර තිබුණි.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාවේ 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට දෙහිඅත්තකණ්ඩිය ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

විගණනයේදී නිරීක්ෂණය වූ ගිණුම්කරණ අඩුපාඩු පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| ගිණුම්කරණ අඩුපාඩුව | විෂයයන් ගණන | වටිනාකම |
|---|---|---|

| | | | |
|---|---|---|---|
| | | | රු. |
| (අ) | මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරීම් | 03 | 6,300 |
| (ආ) | මූල්‍ය ප්‍රකාශනවල වැඩියෙන් දැක්වීම් | 01 | 22,240 |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශනවල අඩුවෙන් දැක්වීම් | 01 | 81,450 |

### 1.3.2 නොසැසඳුනු ගිණුම්

ගිණුම් විෂයයන් 03 කට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව ශේෂයන්ගේ එකතුව රු.1,753,865 ක් වූ අතර, උපයෝගී ලේඛන අනුව එම ශේෂයන්ගේ එකතුව රු.1,820,138 ක් වීමෙන් රු.66,273 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.

### 1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොවීම නිසා රු.16,749,469 ක් වූ ගිණුම් විෂයයන් 05 ක් විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

### 1.3.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 153 වගන්තිය | සේවාවන් හා සැපයීම් සම්බන්ධයෙන් මසකට රු.50,000 ක් හෝ වසරකට රු.500,000 ක් ඉක්මවන නිශ්චිත ගාස්තු මත 5% ක රඳවා ගැනීමේ බදු අයකර එළඹෙන මාසයේ 15 දින හෝ ඊට පෙර දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ගේ ගිණුමට ප්‍රේෂණය කළයුතු වුවත්, රු.1,109,134 ක් වූ නිශ්චිත ගාස්තු මත අයකළ යුතු රු.55,516 ක රඳවා ගැනීමේ බදු අයකර නොතිබුණි. |
| (ආ) | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා | මුදල් හෝ ගබඩා කටයුතු භාරව ක්‍රියා කරන |

| | |
|---|---|
| පරිපාලන) රීති 180 | නිලධාරීන් සහ ආදායම් එකතු කිරීමේ කටයුතු හා සම්බන්ධ රාජකාරී ඉටුකරන නිලධාරීන් විසින් මුදලින් හෝ නිශ්චල දේපලක් හෝ රක්ෂණ සහතිකයක් මඟින් ඇපකරයක් ඉදිරිපත් කළයුතු වුවත්, සභාවේ නිලධාරීන් විසින් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඇ) 2007 පෙබරවාරි 26 දිනැති අංක 424 හා 2010 සැප්තැම්බර් 01 දිනැති අංක 446 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සභාපතිවරයාගේ සහ උප සභාපතිවරයාගේ ජංගම දුරකථන වෙනුවෙන් ලබාගත් පෙර ගෙවුම් කාඩ්පත් වෙනුවෙන් සභා අරමුදලින් පිළිවෙලින් රු.42,000 ක් හා රු.36,000 ක් වශයෙන් ගෙවීම් කර ඇතත්, එම ජංගම දුරකථනවල හිමිකාරීත්වය සහ එකී කාඩ්පත් එම නිලධාරීන්ට අයත් දුරකථන සඳහාම භාවිත කළේද යන්න තහවුරු කර ගත හැකි සාක්ෂි නොතිබුණි. |

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.485,914 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.520,439 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තු ගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

2010 2009

| | ආදායම් විෂය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|---|---|---|
| | | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| (අ) | වරිපනම් හා බදු | 776 | 690 | 374 | 780 | 418 | 319 |
| (ආ) | බදු කුලී | 2,532 | 2,422 | 3 | 2,342 | 2,113 | 151 |
| (ඇ) | බලපත්‍ර ගාස්තු | 962 | 959 | 80 | 1,000 | 895 | 82 |
| (ඇ) | වෙනත් ආදායම් | 7,406 | 7,499 | 189 | 6,906 | 6,169 | 299 |

2.2.2 උසාවි දඩ

විවිධ ආඥා පනත් යටතේ මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් 2010 දෙසැම්බර් 31 දින දක්වා අයකර ඇති රු.76,166 ක උසාවි දඩ මුදලක් සභාවට ලැබිය යුතුව තිබුණි.

2.2.3 වෙළඳ බලපත්‍ර ගාස්තු

(අ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 59 අනුව සමාලෝචිත වර්ෂයේදී සභා බල ප්‍රදේශය තුල සමීක්ෂණයක් සිදුකර 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 150(1) වගන්තිය ප්‍රකාර බලපත්‍ර ගාස්තු අයකිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 67 අනුව සමාලෝචිත වර්ෂයේදී සමීක්ෂණයක් සිදුකර වෙළඳ ස්ථාන ප්‍රමාණයේ අඩුවැඩිවීම් ඇතුළත්ව සකසන ලද ලේඛන හෝ වාර්ෂික වාර්තා නොතිබීමෙන් සියළු වෙළඳ ස්ථාන සඳහා ගාස්තු අයකර තිබුණු බව තහවුරු වී නොතිබුණි.

2.2.4 වරිපනම් බදු

සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සහ අධ්‍යාපන දෙපාර්තමේන්තුව වෙතින් වර්ෂයකට අධික කාලයක සිට අයවිය යුතුව තිබුණු රු.133,631 ක් වූ හිඟ වරිපනම් බදු අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 2.3 වියදම් ව්‍යුහය

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා සභාවේ අයවැයගත හා තථ්‍ය වියදම අදාල විචලනයන්ද සමඟ පහත දැක්වේ.

| වියදම් විෂයය | 2010 | | | 2009 | | |
|---|---|---|---|---|---|---|
| | අයවැයගත | තථ්‍ය | විචලනය | අයවැයගත | තථ්‍ය | විචලනය |
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| පුනරාවර්තන වියදම් | | | | | | |
| පෞද්ගලික පඩිනඩි | 7,525 | 5,936 | 1,589 | 7,128 | 5,453 | 1,675 |
| අනෙකුත් | 4,598 | 5,148 | (550) | 3,586 | 3,125 | 461 |
| උප එකතුව | 12,123 | 11,084 | 1,039 | 10,714 | 8,578 | 2,136 |
| ප්‍රාග්ධන වියදම | 3,100 | 3,152 | (52) | 151 | 20,019 | (19,868) |
| මුළු එකතුව | 15,223 | 14,236 | 987 | 10,865 | 28,597 | (17,732) |

## 2.4 මානව සම්පත් කළමනාකරණය

2010 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | සේවක ශ්‍රේණිය | අනුමත | තථ්‍ය |
|---|---|---|---|
| (i) | මාණ්ඩලික | 01 | 01 |

| | | | |
|---|---|---|---|
| (ii) | ද්විතීයික | 12 | 09 |
| (iii) | ප්‍රාථමික | 15 | 13 |
| (iv) | වෙනත් (අනියම්, තාවකාලික) | - | 06 |
| | | ----- | ----- |
| | | 28 | 29 |
| | | === | === |

2.5 වත්කම් කළමනාකරණය

2.5.1 නිශ්ක්‍රීය භෞතික සම්පත්

සභාව සතුව පැවති වටිනාකම රු.225,000 ක් වූ අංක 37 ශ්‍රී 1327 දරන ට්‍රැක්ටරය 2004 ජූනි 08 වැනි දින සිට නිශ්ක්‍රීයව පැවතුණි.

2.5.2 ලැබිය යුතු ගිණුම්

(අ) 2010 දෙසැම්බර් 31 දිනට වර්ෂ 06 සිට වර්ෂ 18 දක්වා කාලයක් ඉක්මවා තිබුණු ණයගැතියන් 06 දෙනෙකුගෙන් ලැබිය යුතුව තිබුණු මුදල රු.99,439 ක් වූ අතර, වර්ෂයකට වඩා පැරණි කර්මාන්ත ණයගැතියෝ රු.1,254,269 ක් විය.

(ආ) 1998 වර්ෂයේ සිට පැවත එන පෙර ගෙවුම් රු.25,000 ක් නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

2.6 අවිධිමත් ගණුදෙනු

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තියේ විධිවිධාන අනුව විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය නොමැතිව සංග්‍රහ වියදම් සඳහා නියමිත සීමාව ඉක්මවා රු.16,862 ක් සභා අරමුදලෙන් වැය කර තිබුණි.

2.7 අභ්‍යන්තර විගණනය

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානයක් යොමු කෙරේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) ණයගැති හා ණයහිමි පාලනය

(ඉ) වාහන උපයෝජනය

(ඊ) ගබඩා පාලනය